වෘත්තිකයන්ගේ ජාතික පෙරමුණ
Professionals' National Front
66/1, Havelock Rd. (Thummulla) Colombo 05

Telephone : 076 6846623

Email : pnflanka@gmail.com

**2024.09.11**

සියලුම මාධ්‍ය ආයතන වෙත,

**<u>මාධ්‍ය ප්‍රකාශය</u>**

# Policy Watch!

## <u>2024 ජනාධිපතිවරණ අපේක්ෂක ප්‍රතිපත්ති අධ්‍යයනය-පළමු කරුණු දැක්වීම</u>

මහජනතාව ප්‍රජාතාන්ත්‍රවාදය තහවුරු කිරීම පිණිස සිය ඡන්දය ප්‍රකාශ කළ යුතුය. එහිදී සමාජය මත නැගී එන හැඟීම්බර අදහස් වලට කොටු නොවී, කඳවුරුවලට සහ ජයග්‍රහණය කළ හැකි යැයි අපේක්ෂිත පාර්ශවයන්ට සීමා නොවෙමින් නිදහස් ව සහ විමසිලිවත්ව කරුණු විමසා සුදුසු අපේක්ෂකයෙකුට ඡන්දය ප්‍රකාශ කිරීම ඒ මහජනතාවගේ වගකීමකි.

ඒ සඳහා පළමුව ඒ ඒ අපෙක්ෂකයන්ගේ ප්‍රතිපත්ති විමසා බැලීම වැදගත් වේ. අපේක්ෂකයින් 39 දෙනෙකුගේ ප්‍රතිපත්ති අධ්‍යයනය කිරීම අපහසු කාර්යයක් වියහැකි බැවින් නාමයෝජනා භාරදුන් දිනට පසු දින සිටම අපි මෙම කාර්යය පහසු කිරීම පිණිස Policy Watch ව්‍යාපෘතිය ආරම්භ කළෙමු. එතැන් සිට අප නිරීක්ෂණය කළ කරුණු,

1. **<u>ප්‍රතිපත්ති ප්‍රකාශන නැති අපේක්ෂයන්:</u>** අපේක්ෂයන් 39දෙනා අතරින් සුළුතරයක් පමණක් සිය ප්‍රතිපත්ති ප්‍රකාශන ඉදිරිපත් කොට තිබේ. - මේ ප්‍රතිපත්ති නැති අපේක්ෂකයන් අතරින් කොටසක් ව්‍යාජ(dummy) අපේක්ෂකයන් විය හැකිය. - ජනතාවගේ මුදල් වියදම් කරමින් ඔවුන්ගේ ඡන්දය වෙනුවෙන් යමෙකු ඉදිරිපත් වේ නම්, ජනතාවට ඔවුන් හඳුනා ගැනීමට අවශ්‍ය අපේක්ෂක ප්‍රතිපත්ති ජනතාව ඉදිරියේ දක්වා නොසිටීම අපේක්ෂක වගකීම පැහැර හැරීමකි.
2. **<u>කෙටි ප්‍රතිපත්ති ප්‍රකාශන:</u>** ප්‍රතිපත්ති ඉදිරිපත් කළ අපේක්ෂකයන් අතුරෙන් කොටසක් ඉතා කෙටි ප්‍රතිපත්ති ප්‍රකාශන ඉදිරිපත් කොට තිබේ. එමගින් ජනතාවට පැහැදිලි අවබෝධයක් හිමි නොවේ. - වියදම් සලකා ඉලෙක්ට්‍රොනික මාධ්‍ය ඔස්සේ හෝ බෙදා හැරීම පිණිස ප්‍රමාණවත් පැහැදිලි කිරීම් සහිත ප්‍රතිපත්ති ප්‍රකාශන ඉදිරිපත් කිරීම අපේක්ෂකයන්ගේ වගකීමකි. මෙය කියවීමට අපහසු දීර්ඝ විස්තර ලිවීමට අරාධනාවක් නොව, ප්‍රශස්ථ කරුණු දැක්වීමක් කළයුතු බවට සටහනකි.
3. **<u>ප්‍රතිපත්ති ඉදිරිපත් කිරීමට පමාවීම:</u>** ජනතාවට මේ ප්‍රතිපත්ති කියවා අවබෝධකොට ගැනීමට සාධාරණ කාලයක් ලබාදිය යුතුය. එහෙත් මෙවර බොහෝ අපේක්ෂකයින් ඒ සඳහා අතිශය ප්‍රමාද විය. - සමහර ප්‍රතිපත්ති ප්‍රකාශන නිකුත් වූයේ තැපැල් ඡන්දයට පෙර ඉදිරිපත් කිරීමට මතක් ව කළබල වූ හෙයිනි. රට වෙනුවෙන් අවශ්‍ය ප්‍රතිපත්ති සහ වැඩපිළිවෙල හඳුනාගෙන එය ජයග්‍රහණය කිරීමට අපේක්ෂකයෙකු ඉදිරිපත් වේ නම් අපේක්ෂකයාට පළමුව ප්‍රතිපත්ති ප්‍රකාශය පැවතිය යුතුය. එහෙත් මේ සිදුවනුයේ යම් අපේක්ෂකයෙකු ජයග්‍රහණය කරවීමට ප්‍රතිපත්ති කිපයක් ප්‍රකාශය පමණි.
4. **<u>ප්‍රතිපත්ති ප්‍රකාශන හුදු ලියැවිල්ලක් වීම:</u>** අදවනවිට ජනතාවත්, අපේක්ෂකයිනුත් සිය ප්‍රතිපත්ති ප්‍රකාශ ඡන්ද කාලයට ඉදිරිපත් කරන හුදු ලියැවිල්ලක් ලෙස හඳුනාගැනීමට පුරුදුව තිබෙයි. - ප්‍රතිපත්ති ප්‍රකාශන එසේ ඡන්ද කාලයට පමණක් ඉදිරිපත් කරන ලියැවිල්ලක් නොව ඉන් ඔබ්බට ගිය ජයග්‍රහණය කළ පාර්ශවයන්ගේද අනෙකුත් පාර්ශවයන්ගේද වගකීමක් ලෙස හඳුනාගත යුතුය. නිශ්චිත සාධාරණ කරුණු නොදක්වා ඉදිරිපත් කළ ප්‍රතිපත්තීන්ගෙන් වෙනස්ව කටයතු කිරීම වගකීම් පැහැර හැරීමක් සහ වරදක් ලෙස සමාජය හඳුනාගත යුතුය.

තවද ප්‍රතිපත්ති අධ්‍යයනයේදී පහත කරුණු අප විසින් පොදුවේ හඳුනා ගැනිනි.

5. **<u>ක්ෂේත්‍රයන් පුළුල්ව ආවරණය නොවේ:</u>** අත්‍යවශ්‍ය දේශපාලන සහ පරිපාලන ප්‍රතිසංස්කරණ, ආර්ථික වැඩපිළිවෙල, සමාජ සුභ සාධනය සහ මානව සම්පත් සංවර්ධනය, ජාතික ආරක්ෂාව සහ විදේශ ප්‍රතිපත්තිය මෙන්ම පරිසරය යන ක්ෂේත්‍රයන් 5 ඔස්සේ අධ්‍යයනයේදී ප්‍රතිපත්ති ප්‍රකාශන මේ ක්ෂේත්‍රයන් ප්‍රමාණවත් පරිදි ආවරණය කිරීමට අසමත්ව තිබේ.
6. **<u>අර්බුදයන් පැහැදිලිව නොදැකීම</u>** අප මුහුණ දෙමින් සිටින ආර්ථික අර්බුදය ස්වයංජනිත කාරණාවක් නොව අත්‍යවශ්‍ය දේශපාලන සහ පරිපාලන ප්‍රතිසංස්කරණ, ආර්ථික සැලස්ම, සමාජ සුභ සාධනය සහ මානව සම්පත් සංවර්ධනය, ජාතික ආරක්ෂාව සහ විදේශ ප්‍රතිපත්තිය යන අංශයන් හි වර්ධනය වියයුතු අංගයන්

වර්ධනය නොවීම මත සිදුවූ බැව් යම් යම් සටහන් ඇතත්, ඒ පැහැදිලි පෘථුල අවබෝධයකින් ප්‍රතිපත්ති සම්පාදනය කොට ඇති බැව් සැලකිය නොහැකිය.

7. **<u>අවස්ථාව තිබියදී වෙහෙස නොවූ ප්‍රතිසංස්කරණ:</u>** බොහෝ නීති ප්‍රතිසංස්කරණ යෝජනා කොට තිබේ. මේ ජනාධිපතිවරයෙකු පත් කිරීමේ අවස්ථාවයි. විධායක බලය පිණිස මිස මේ නීති සෑදීමේ බලය පිණිස පවත්වන ඡන්දයක් නොවේ. ඒ සඳහා බලය ඇත්තේ ව්‍යවස්ථාදායකය හෙවත් පාර්ලිමේන්තුවටයි. මේ ප්‍රතිපත්ති යෝජනා කළ බොහො දෙනා පාර්ලිමේන්තු මන්ත්‍රී ධූරයන් ඇති පාර්ශවයන්ට අයත් වේ. ව්‍යවස්ථාදායකය තුල ඔවුනට ඇති එම අවස්ථාව යොදාගෙන ඒ සඳහා නොවෙහෙසී තම ප්‍රතිපත්ති ප්‍රකාශයන්හි පමණක් මෙලෙස අන්තර්ගත කරන්නේද යන්න පිළිබඳව ජනතාව අවබෝධ කර ගත යුතුය.
8. **<u>සැමොම එකඟ වුවත් සිදු නොවේ:</u>** බොහෝ ප්‍රතිපත්ති ප්‍රකාශන එකම ආකාරය වේ. සියලු දෙනා තම ප්‍රතිපත්ති මගින් පිළිගන්නා කරුණු ඇතත් ඒවා සිදු නොවීම පුදුමාකරය. ඒ කටයුතු සිදුනොවීම ගැන බලය ඇති නැති, ඒ සඳහා උත්සාහ නොදැරූ කිසිවෙකුට එම වගකීමෙන් ඉවත් විය නොහැකිය. උදාහරණ ලෙස පෙර පාසැල් නියාමනය සහ පෙර පාසැල් සඳහා පුහුණුවක් ලබාදිය යුතු බැව් සැලකියයුතු විස්තර සහිත ප්‍රතිපත්ති ප්‍රකාශ ඉදිරිපත් කළ සියලු දෙනා පිළිගනී. එහෙත් අදටත් එය සිදුව නොමැති වීම ඉන් එක් සරල උදාහරණයකි.
9. **<u>සරලව ගැනීම:</u>** රටක ප්‍රතිපත්ති සම්පාදනය යනු හුදෙක් අදහස් සටහන් කිරීමක් නොවේ. සැමවිටම ඉතා කල්පනාකාරීව ගතයුතු තීරණයන් වේ. රටේ අධ්‍යාපනය, ආර්ථිකය , දේශපාලනය ආදීවූ ක්ෂේත්‍රයන් සඳහා ගනු ලබන තීරණ හෝ විසඳුම් සමහරක් සෘජුව දැකිය හැකිය. තවත් සමහරක් සඳහා එළැඹෙන ක්‍රමවේදයක් මිස නිශ්චිත විසඳුම් කිහිපදෙනෙකුගේ සිතැඟි පරිදි සටහන් කළ නොහැකිය.  මේ වෙනස හඳුනා නොගෙන ප්‍රතිපත්ති සටහන් කොට ඇති බැව් දැකිය හැකිය.
10. **<u>අරමුදල්,ප්‍රමුඛතා, නිශ්චිත කාල වකවානු:</u>** මේ ප්‍රතිපත්ති තුල සඳහන් විශාල පරිමාණ ව්‍යාපෘති, සුභසාධන සහ වැටුප් ඉහළ දැමීම් ආදිය සිදුකිරීම සඳහා අවශ්‍ය මුදල් සපයා ගන්නා අයුරු ප්‍රමාණවත් ලෙස පෙන්වා නොදේ. බදු ලිහිල් කිරීම් ආදිය සියලු දෙනා පිළිගනිමින්,ඔවුන් පෙන්වා දෙන සුළු ප්‍රතිසංස්කරණයන් තුලින් රජයේ ආදායම ඉහළ නැංවීම සිදු කිරීම පහසු නොවන අතර එම යෝජනා බොහොමයකින් ප්‍රතිලාභයක් ලැබීමටද සැලකිය යුතු කාලයක් ගතවෙයි. එහෙයින් එම මුදල් සපයා ගන්නෙ ණය මගින්ද, නො එසේ නම් ප්‍රමුඛතා අනුපිලිවෙල සහ නිශ්චිත කාල වකවානු ආදිය සඳහන් කළයුතු වුවත් එසේ සිදු කිරීමට අපොහොසත්ව තිබේ.
11. **<u>සංගත නොවීම:</u>** එක් ක්ෂේත්‍රයක් සම්බන්ධව පවසන වර්ධනයන් තවත් ප්‍රතිපත්තියකදී නොසලකා හැරීම. උදාහරණ ලෙස රාජ්‍ය වියදම අඩුකරන බව පරිපාලනය කාර්යක්ෂම කෙරෙන බැව් ආදිය සටහන් කළත්, වරින් වර රාජ්‍යව්‍යුහය තුල දැනටමත් ඒ සඳහා ආයතන ඇති බැව් නොසලකමින්, විකල්ප ආයතන තැනින් තැන යෝජනා කිරීම බොහෝ ප්‍රතිපත්ති තුළ දැකිය හැකියි. මේ එක් උදාහරණයක් පමණි. එකිනෙක හා ගැලපෙන සහ එකට ක්‍රියාත්මක විය හැකි ලෙස ප්‍රතිපත්ති සහ සැලසුම් සම්පාදනයේදී කල්පනාකාරී විය යුතුය.
12. **<u>හේතු සඳහා පිළියම් නොයෙදීම:</u>** බොහෝ කාරණාවලදී යම් යම් ප්‍රතිසංස්කරණ සිදු නොවීමට හේතුවූ ගැටළු සඳහා විසඳුම් ලබා නොදී, සාකච්ඡා නොකොට අදාළ ප්‍රතිසංස්කරණය ඉටු කරන බැව් සටහන් කිරීම දුර්වලය. උදාහරණ ලෙස බොහෝ ගැටළු විසඳීමට රාජ්‍ය අංශය ඩිජිටල්කරණය කිරීමට යෝජනා කරයි. දශක දෙකකට වඩා කාලය ගතකොට රුපියල් බිලියන ගනනින් වටිනා ව්‍යාපෘති ඒ ඒ ආයතනයේ වරින්වර සිදුකොට එහෙත් ප්‍රතිපල නොලැබීමට හේතුවූ කරුණු වටහාගෙන ඒවා විසඳන අයුරු සාකච්ඡා නොවන සටහනක ප්‍රතිඵලය මෙතෙක් වූ සිදුවීම් වලින් වෙනස් වීමට ඇත්තේ ඉතා අඩු අවස්ථාවකි.

බොහෝ දෙනෙකු මේ ප්‍රතිපත්ති ඉටු නොකිරීම වරදක් ලෙස දුටුවත් අප මේ අධ්‍යයනය තුළ දකින්නේ එම වරදේ දෙපැත්තක් ඇති බවයි. ප්‍රතිපත්ති ඉටු නොකිරීම මෙන්ම ඉටු කළ නොහැකි ප්‍රතිපත්ති ඉදිරිපත් කිරීමයි. රටේ උන්නතිය පිණිස යන්න ඉක්මවා ජනතාව රැවටීම පිණිස යන්න ප්‍රමුඛතාව ගෙන ඇති බවයි.

මේ සියල්ල ඉතා ඉක්මනින් සංසන්දනාත්මකව එහෙත් සංක්ෂිප්තව අපගේ අධ්‍යයන වාර්තාවෙන් ඔබ වෙත සැපයීමට පොරොන්දුවෙමින් නැවතත් මතක් කොට සිටිනුයේ, මේ ප්‍රතිපත්ති අවබෝධයෙන් විමසා ඔබේ ඡන්දය සවිඥානිකව භාවිත කරන ලෙසයි.



කපිල රේණුක පෙරේරා
සභාපති-වෘත්තිකයන්ගේ ජාතික පෙරමුණ